# නිර්වාණය විනිශ්චයෙහි ලා නිශේධ පද භාවිත කිරීමේ අරමුණ කුමක් ද?

දිනේෂ මධුශංඛ රත්නායක[1]

**හැඳින්වීම**

භාෂාව යනු මෙවලමකි. එය මිනිසාගේ සන්නිවේදන කාර්යය පහසු කරයි. මානව සන්තානයේ ඇතිවන අදහස්, හැඟීම් සන්නිවේදනය කිරීම මානව භාෂාවේ ප්‍රමුඛ කාර්යය යි. කලින් කලට දේශයෙන් දේශයට ජනවර්ගයෙන් ජනවර්ගයට භාෂාව වෙනස් වේ. කාල දීප වශයෙන් වෙනස් වන භාෂාවේ නිර්මාපකයා මිනිසා ය. කෙසේ නමුත් බුදුදහමේ සාකච්ඡා කෙරෙන ප්‍රස්තුතයට අනුව භාෂාව සම්මුතියකි. නිර්වාණය පර්මාර්ථ සත්‍යයකි. එය භාෂාවකින් පූර්ණ වශයෙන් විග්‍රහ කළ හැකි ද යන්න ගැටලු සහගත ය. අතීන්ද්‍රිය ව ප්‍රත්‍යක්ෂ කළ යුතු සත්තාවයක් වශයෙන් නිර්වාණය විස්තර වේ. නිර්වාණය කිසිවෙකුගේ නිර්මාණයක් නො වන අතර, බුදුදහම පෙන්වා දෙන පුද්ගල පරම නිෂ්ඨාව ද නිර්වාණය යි. සම්මුති භාෂාව හා පරමාර්ථ නිර්වාණය විෂම සඞ්කල්පද්වයකි. නමුත් පුද්ගලයා ආර්යමාර්ගය ඔස්සේ පරම නිෂ්ඨාව කරා මෙහෙයවීමේ දී සම්මුති භාෂාව උපයෝගී කොට ගෙන තිබේ. පෙළ තුළ නිර්වාණය විනිශ්චයෙහි ලා නිශේධාර්ථ (නැත යන අර්ථවත්) පද රාශියක් භාවිත කොට ඇති බව පෙනේ.

**පර්යේෂණ අරමුණ**

පෙළ තුළ නිර්වාණය විනිශ්චයෙහි ලා නිශේධාර්ථ (නැත යන අර්ථවත්) පද භාවිත කොට ඇත්තේ කුමන හේතුවක් නිසා දැයි විමර්ශනය කිරීම මෙහි ප්‍රමුඛ අරමුණ යි.

**පර්යේෂණ ගැටලුව**

නිර්වාණය විනිශ්චයෙහි ලා නිශේධ පද භාවිත කිරීමේ අරමුණ කුමක් ද?

**පර්යේෂණ මූලාශ්‍රය භාවිතය හා පර්යේෂණ සීමාව**

මෙම මාතෘකාව සාකච්ඡා කිරීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය කිහිපයක් භාවිත කිරීමට සිදු විය. එහි දී දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය, සුත්තනිපාතය, උදානපාළි වැනි ප්‍රාථමික මූලාශ්‍රයන් සහ ද්විතීයික මූලාශ්‍රය ලෙස තුලනාත්මක වාග්විද්‍යාව, ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, සිංහල අකාරාදිය, සරසවි සිංහල - සිංහල ශබ්දකෝෂය වැනි මූලාශ්‍රය රාශියක් භාවිත කරන ලදී. ත්‍රිපිටකයේ නැත යන අර්ථය ඇති පද නිවන හැඳින්වීම සඳහා භාවිත වී ඇති ආකාරය විමසීම මෙහි සීමාව යි.

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල**

භාෂාව යනු කුමක් දැයි අර්ථකථනය කර ගැනීමේ දී කෝෂග්‍රන්ථ දෙස අවධානය යොමු කිරීම වැදගත් වේ. **'භාෂා'** යන්නෙන්; තෙපුල කියන ලදඃ **"සුභාෂිත වචනය, මනා කොට කියන ලද බස"** (ශ්‍රී රේවත

---

[1]. උපාධි අපේක්ෂක, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම. *Madusankadinesh444@gmail.com*

හිමි, 2001: 550). යන අර්ථ ද **සිතේ අදහස් පැවසීමට ඉවහල් වන ශබ්ද සමූහය, අදහස් හුවමාරුව, සන්නිවේදනය, හැඟීම් පළ කිරීම ආදිය සඳහා මිනිසුන්ට නිපදවිය හැකි ශබ්ද සමුදායන්, සුවිශේෂී ව සංවිධානය කරගත් ශබ්දමාලාව හා එහි භාවිතය,** (හෙට්ටිහේවා, 2010: 933). බස හෙවත් භාෂාව ලෙස හැඳින්වේ. මහා සිංහල ශබ්දකෝෂය 'භාෂා' **යන්නෙන් වචන උපයෝගී කරගෙන අදහස් හුවමාරු කිරීමේ මාධ්‍යය, අදහස් පැවසීමට ඉවහල් වන ශබ්ද හා රීති සමූහය, කථාව වචනය හා ඒවා කථා කිරීමේ දී ව්‍යවහාර කරන ක්‍රමය භාෂාව බව පෙන්වා දී තිබේ,** (හරිස්චන්ද්‍ර විජයතුංග, 2008: 1285) මනුෂ්‍යයන් අදහස් හුවමාරු කර ගන්නා ප්‍රධාන මාර්ගය භාෂාව යි. උක්ත කරුණු අනුව භාෂාව මිනිසා විසින් නිර්මාණය කරගන්නා ලද සන්නිවේදන මෙවලමක් බව පෙනේ.

භාෂාව සම්මුතියකි. සම්මුති භාෂාව ආදානග්‍රාහී ලෙස ගැනීම වාග්සඞ්ග්‍රාමයට යොමු වන බවත් ජනපද ව්‍යවහාරය ඉක්මවා යෑමෙන් දෝෂ දර්ශනයට ලක්වන අකාරයත් අරණවිභඞ්ග සූත්‍රයේ පෙන්වා දී තිබේ.

**"ඉධ භික්ඛවෙ, තදෙව එකච්චෙසු ජනපදෙසු පාතීති සඤ්ජානන්ති, පත්තන්ති සඤ්ජානන්ති, විත්ථන්ති සඤ්ජානන්ති, සරාවන්ති සඤ්ජානන්ති, ධාරොපන්ති සඤ්ජානන්ති, පොණන්ති සඤ්ජානන්ති, පිසීලවන්ති සඤ්ජානන්ති. ඉති යථා යථා නං තෙසු තෙසු ජනපදෙසු සඤ්ජානන්ති",** (මජ්ඣිමනිකාය 3, 2005: 492).

මෙය ම සත්‍යය, අන් ඒවා අසත්‍යය යනා දී වශයෙන් වාග්සඞ්ග්‍රාමයට මුල් වන්නේ ජනපද නිරුක්ති අභිනිවේසනය යි. එක් ජනපදයක 'පාති' යනුවෙන් හැඳින්වෙන භාජනය වෙනත් ජන පදයක 'පත්ත' ලෙස හැඳින්වේ. එම භාජනය ම වෙනත් ජනපදවල 'විත්ථ', 'සරාව', 'ධාරොප' යන වෙනත් නම්වලින් හැඳින්වේ. 'පාති' යනුවෙන් ව්‍යවහාර කරන ජනපදයේ මිනිසුන් භාජනයේ සැබෑ නම 'පාති' ලෙස ගෙන අනික් පරියාය යෙදුම් වැරදි ලෙස ගැනීම, වාග්සඞ්ග්‍රාමයට මුල් වන ආකාරය එම සූත්‍රයේ පෙන්වා දී තිබේ. මේ අනුව භාෂාවේ සම්මුතික ලක්ෂණ ඍජු ව දැකගත හැකි ය. කාල, දීප, ජනපද වශයෙන් වෙනස් වන භාෂාව අදානග්‍රාහී ව ගැනීම අවැඩදායක ය. මේ ආදී ගැටලු රාශියක් භාෂාව සම්බන්ධයෙන් උද්ගත ව ඇත්තේ භාෂාව සම්මුතියක් බැවිනි.

යථාර්ථය භාෂාවට නැඟිය නො හැකි ය. අල්පමාත්‍ර ලෙස හෝ යථාර්ථය පැහැදිලි කරදීමට භාෂාව උපයෝගී කොටගත් කල්හි ඤාණපටුත්වයෙන් යුත් සත්වයන් එය වැරදි ලෙස අර්ථකථනය කර ගැනීම ස්වභාවයකි. සංයුත්තනිකායේ වජිරා සූත්‍රයේ මෙයට අදාළ මනා වූ නිදසුනක් දැකිය හැකි ය. පෘථග්ජනයන්ට නිර්වාණගාමී ප්‍රතිපදාව දැක්වීමේ දී 'සත්ව', 'පුද්ගල' ආදී ව්‍යවහාර සම්මුති මාත්‍රයෙන් පමණක් ගෙන භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කළහ. එම සම්මුති යොදා ගැනීම ඇතැම්හු වැරදි ලෙස අර්ථකථනය කරගත් බව පෙනේ.

**"කෙනා'යං පකතො සත්තො කුවං සත්තස්ස කාරකො**

**කුවං සත්තො සමුප්පන්නො කුවං සත්තො නිරුජ්ඣති."** (සංයුත්තනිකාය, 2006: 246)

සත්ත්වයා කවරෙකු විසින් කරන ලද්දේ ද? සත්ත්වයා කළ තැනැත්තා කොහි ද? සත්ත්වයා කොහි හට ගත්තේ ද? සත්ත්වයා කොහි නිරුද්ධ වේ ද? යනාදී වශයෙන් පවිටු මාරයා ප්‍රශ්න රාශියක් වජිරා මෙහෙණියගෙන් විමසී ය. එයට පිළිතුරු දෙන වජිරා මෙහෙණිය,

**"යථාහි අඞ්ගසම්භාරා - හොති සද්දො රථො ඉති,**

**එවං ඛන්‍ධෙසු සන්තෙසු - හොති සත්තො'ති සම්මුති."** (සංයුත්තනිකාය, 2006: 246)

අඞ්ගෝපාඞ්ග සමූහයක් එකතු වීමෙන් 'රථය' යන ශබ්දය (නාමය) වේ ද එසේ ම පඤ්චස්කන්‍ධය ඇති කල්හි 'සත්ත්වයා' යන ලෝක ව්‍යවහාරය (සම්මුතිය) වේ. **"සුද්ධසඞ්ඛාරපුඤ්ජො'යං නයිධ සත්තුපලබ්භති",** (සංයුත්තනිකාය, 2006: 246) හුදු සංස්කාර සමූහයක් මිස මෙහි සත්ත්වයෙක් දක්නට නො ලැබේ. 'මම', 'මාගේ' වැනි භාෂා සඞ්කල්පයන් පුද්ගලයා නිතර පුරුදු පුහුණු කරන බැවින් එම භාෂාමය සඞ්කල්පයන්ගෙන් වියුක්ත වීමට සත්ත්වයෝ අකමැති වෙති. එම නිසා ම තණ්හා-මාන-දිට්ඨි ගොඩනගා ගෙන යළි යළි සංසාරගත වීම පෘථග්ජන ස්වභාවය යි.

තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළ නිර්වාණය ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගත යුත්තකි. නිර්වාණගාමී ප්‍රතිපදාවට පුද්ගලයා පෙළඹවීම සඳහා උන්වහන්සේ ප්‍රධාන වශයෙන් භාෂාව උපයෝගී කොට ගත්හ. නිර්වාණය භාෂා ව්‍යවහාරයෙන් විස්තර කිරීම අපහසු දුෂ්කර කර්තව්‍යයක් බව වටහා ගත හැකි ය. නිර්වාණය විස්තර කිරීම පිණිස විවිධ වූ පර්යාය පද රාශියක් පෙළදහම තුළ දක්වා ඇත්තේ ඒ නිසා විය යුතු ය. **'අනාසව'**, **'සච්ච'**, **'පාර'**, **'නිපුණ'**, **'සුදුද්දස'**, **'අජර'**, **'ධුව'**, **'අපලොකිත'**, **'අනිද්දස්සන'**, **'නිප්පපඤ්ච'**, **'සන්ත'**, **'අමත'**, **පණීත'**, **'සිව'**, **'ඛෙම'**, **'තණ්හක්ඛය'**, **'අච්ඡරිය'**, **'අබ්භුත'**, **'අනීතික'**, **'අනීතිකධම්ම'**, **'නිබ්බාන'**, **'අබ්‍යාපජ්ඣ'**, **'විරාග'**, **'විසුද්ධි'**, **'මුත්ති'**, **'අනාලය'**, **'දීප'**, **'ලෙණ'**, **'තාණ'**, **'සරණ'**, **'පරායණ'** (සංයුත්තනිකාය 4, 2006: 656-664). මේ ආදී පරියාය පද දෙස අවධානය යොමු කිරීමේ දී මෙම පද සියල්ල නිර්වාණය හැඳින්වීම සඳහා පරියාය වශයෙන් යෙදූ පදයන් බව පෙනේ. මෙම පද විග්‍රහයන් තුළ නිශේධාර්ථ පද රාශියක් ද දැකගත හැකි ය.

බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දෙනු ලබන පරමාර්ථ සත්‍යය වනාහි ලෝක විෂය, භාෂා විෂය ඉක්ම වූ අතීන්‍ද්‍රිය ප්‍රත්‍යක්ෂයක් වූ එය, බුද්ධාදී ආර්යයන්ගේ ප්‍රඥාවට ගෝචර වන්නකි. සම්මුති ව්‍යවහාරයන් හා සම්මුති සත්‍යය ඉක්ම වූවකි. නිර්වාණය පිළිබඳ වචනාර්ථ විග්‍රහයන් ගැටලුවක් නො වෙතත් එහි ස්වරූපය හා ස්වභාවය පිළිබඳ විවරණයන් විවාදාපන්න බව පෙනේ. විවරණයන් සියල්ල කැටි කරගත් කල්හි එය කොටස් පහක් යටතේ දැක්විය හැකි බව මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ සඳහන් කරයි.

i. නිර්වාණය සත්‍යය වශයෙන් ම පවතින තත්ත්වයකි, (අස්ත්‍යර්ථී).
ii. නිර්වාණය පවතින තත්ත්වයක් නො වේ, (නස්ත්‍යර්ථී).
iii. නිර්වාණය වචනයෙන් ප්‍රකාශ කළ හැක්කක් නො වේ, (අනිර්වචනීය).
iv. නිර්වාණය වචනයෙන් ප්‍රකාශ කළ හැකි තත්ත්වයකි, (නිර්වචනීය).
v. නිර්වාණය ආචාරාත්මක පරිපූර්ණතාවක් මිස එම ආචාරමාර්ගයෙන් විනිර්මුක්ත වූවක් නො වේ.

නිවන පිළිබඳ නිගමන විවිධත්වයක් ගැනීමට ඔවුනොවුන්ගේ පෞද්ගලික දෘෂ්ටිකෝණ බලපායි. නිවන ගැන කෙරෙන විස්තරයන්හි දී නිවනේ ගුණය මිස නිවන කුමක් දැයි නො කියයි. නිබ්බාණධාතුවක අස්තිත්වය පිළිගන්නා නමුදු එය පවතින ස්ථානයක් නොමැත. ලෝකයේ අස්තිත්වයෙන් ගැනෙන ඇතැම් දේවලට ද එබඳු ස්ථානයක් නොමැත. ගින්න මීට හොඳ ම නිදසුන යි. වියලි ලී කැබලි දෙකක් එකට ගැටීමෙන් ගිනි නිපදවිය හැකි ය. නමුත් එම ගින්න ලී කැබලි දෙකෙහි හෝ වෙන යම් තැනක ස්ථාවර ව නො තිබිණි. යම් තැනක ස්ථාවර ව නො තිබීම හේතුව නිසා ගින්න නැතැයි කිව නො හැකි ය. නිවන ද අස්තිත්වයක් ලෙස සැලකෙතත් එය පිහිටි ස්ථානයක් ප්‍රකාශ කළ නො හැක්කේ මේ නිසා ය. ඒ නිසා නිවන අභාවමාත්‍රයක් ලෙස ද සැලකිය නො හැකි ය, (ගල්මංගොඩ, 1994 ፡ 162). මේ අනුව නිර්වාණය විනිශ්චයෙහි ලා ඇතැම්විට නිශේධාර්ථ පද භාවිත කොට ඇත්තේ නිවන සත්‍යය වශයෙන් පවතින නමුත් එය පවතින නිශ්චිත ස්ථානය දැක්වීමට නො හැකි බව ඇඟවීමට සඳහා බව පෙනේ.

**"අත්‍ථි භික්ඛවෙ, තදායතනං යත්‍ථ නෙව පඨවි න ආපො, න තෙජො න වායො, න ආකාසානඤ්ඤායතනං න විඤ්ඤාණඤ්චායතනං න ආකිඤ්චඤ්ඤායතනං න නෙව සඤ්ඤානාසඤ්ඤායතනං නායං ලොකො න පරලොකො න උභො චන්දිමසුරියා තත්‍රාපාහං භික්ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං. අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණමෙවෙතං. එසෙවන්තො දුක්ඛස්සාති",** (උදානපාළි, 2006: 290). යම් තැනක පෘථිවි ධාතුව නැත්තේ ද, ආපෝ ධාතුව නැත්තේ ද, තෙජෝ ධාතුව නැත්තේ ද, වායෝ ධාතුව නැත්තේ ද ආකාසානඤ්ඤායතන සිත නැත්තේ ද, විඤ්ඤාණඤ්චායතන සිත නැත්තේ ද, ආකිඤ්චඤ්ඤායතන සිත නැත්තේ ද, නෙවසඤ්ඤානාඤ්ඤායතන සිත නැත්තේ ද මේ (ස්කන්ධ) ලෝකය නැත්තේ ද (එහි අඳුරක් නැති බැවින් අඳුර දුරලන්නට) සඳ හිරු දෙදෙනෙකුත් නැත්තේ ද, එසේ වූ ඒ ආයතනය (මාර්ගඵල නිවනට අරමුණු වන නිවන) ඇත. මරණයක්, මැරී ඉපදීමක් නැත. මෙය කිසිවක නො පිහිටි, ප්‍රත්‍යයන්ගෙන් නො පවත්නා, කිසි ම අරමුණක නො එල්බෙන දහමකි. මෙය ම දුකෙහි කෙළවර ය.

මහණෙනි, නො උපන්, පහළ නො වූ කිසිවකින් නොකරන ලද ප්‍රත්‍යයෙන් අසංස්කෘත වූ නිර්වාණ ධර්මය (පරමාර්ථ වශයෙන්) ඇත. මහණෙනි, මේ හේතුප්‍රත්‍යයෙන් නො උපන්, නොපහළ වූ නො කරන ලද අසංස්කෘත නිර්වාණ ධාතුව (පරමාර්ථ වශයෙන්) අවිද්‍යමාන නම්, මෙහි හේතු ප්‍රත්‍යයෙන් උපන්, පහළ වූ කරන ලද, සංස්කෘත වූ ස්කන්ධ පඤ්චකයාගේ සංසිඳීමක් නො පෙනෙන්නේ ය. මහණෙනි, යම් හෙයකින් ම නො උපන්, නො පහළ වූ, නො කරන ලද, අසංස්කෘත ධාතුවෙක් පරමාර්ථ වශයෙන් ඇත්තේ ද, එහෙයින් උපන්, පහළ වූ කරන ලද සංස්කෘත වූ ස්කන්ධ පංචකයාගේ සංසිඳීමක් පෙනෙයි. **"අත්‍ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං, නො චෙ තං භික්ඛවෙ අභවිස්සා අජාතං අභූතං අකතං අසඞ්ඛතං නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මා ච ඛො භික්ඛවෙ අත්‍ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං. තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායති",** (උදානපාළි, 2006: 292). මෙසේ 'අජාත', 'අභූත' වැනි පද යොදා තිබෙනුයේ නිර්වාණය විස්තර කිරීම සඳහා ය.

නිවනේ ස්වභාවය විස්තර කරන භාග්‍යවතුන් වහන්සේ පහාරාද අසුරේන්ද්‍රයාට වදාරනුයේ මහා සමුද්‍රයෙහි සිඳී යාමක් හෝ උතුරා යාමක් සිදු නො වන්නා සේ ම බොහෝ භික්ෂූන් වහන්සේලා නිර්වාණයට පත් වුව ද නිර්වාණයේ සිඳීමක් හෝ උතුරා යෑමක් සිදු නො වන බව යි. **"සෙය්‍යථාපි පහාරාද යාව ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති. යා ච අන්තලික්ඛා ධාරා පතන්ති. න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. එවමෙව ඛො පහාරාද බහූ චෙපි භික්ඛූ අනුපදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති. න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති"**, (අඞ්ගුත්තරනිකාය 5, 2006: 90). එසේ ම තවත් වරෙක භාග්‍යවතුන් වහන්සේ බඹයක් පමණ වූ මේ ශරීරය තුළ ම ලෝකයත් ලෝකසමුදයත්, ලෝකනිරෝධයත්, ලෝකනිරෝධගාමිනී ප්‍රතිපදාවත් දක්වා තිබේ. **"ඉමස්මිඤ්ඤෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤාපෙමි, ලොකසමුදයඤ්ච ලොකනිරොධඤ්ච ලොකනිරොධගාමිනිඤ්ච පටිපදන්ති"**, (සංයුත්තනිකාය 1, 2006: 120). යථෝක්ත පෙළපාඨ අනුව නිවන අවේදයිත ස්වභාවයකින් දක්වන්නට වූයේ කුමන හේතුවක් නිසා දැයි පිළිතුරු සෙවීමේ දී පැහැදිලි වන්නේ එය මානසික සංවර්ධනයකින් ප්‍රත්‍යක්ෂ වශයෙන් සාක්ෂාත් කරගත යුත්තක් බවත් එය භාෂාවෙන් විග්‍රහ කිරීම අපහසු බවත් ය. නිවනේ ස්වභාවය ඇතැම් අවස්ථාවන්හි පෙන්වා දී ඇත්තේ උපමානුසාරයෙනි. **"නිබ්බන්ති ධීරා යථා'යං පදීපො"** (සුත්තනිපාතය, 2006: 72), **"නිබ්බාණං පරමං සුඛං"** (ඛුද්දකනිකාය 1, 2006: 76). ඉන්ද්‍රිය ආශ්‍රයෙන් අත්විඳිය නො හැකි වාස්තවික සත්තාවක් නො ව අනුභූතිවාදී ව විස්තර කළ නො හැකි නිර්වාණය අධිගම කළ යුත්තකි. එය භාෂාවට නැඟිය නො හැකි ය. නිර්වාණය භාෂාවේ සීමාවන් ඉක්මවා පැවතීම එයට හේතුව යි.

වරක් සාමණ්ඩකානි නම් පිරිවැජියා සැරියුත් තෙරුන් වහන්සේගෙන් මෙසේ විමසී ය. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නිවන යැයි කියනු ලැබේ. ඇවැත්නි නිවන නම් කවරේ ද? **"නිබ්බානං නිබ්බානන්ති ආවුසො සාරිපුත්ත වුච්චති. කතමන්නු ඛො ආවුසො නිබ්බානන්ති"** සැරියුත් තෙරුන් වහන්සේ එයට පිළිතුරු ලෙස රාගය ක්ෂය කිරීම, ද්වේෂය ක්ෂය කිරීම, මෝහය ක්ෂය කිරීම නිර්වාණය බව පෙන්වා දුන්හ. **"යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති නිබ්බානන්ති"**, (සංයුත්තනිකාය, 2006: 488).

**පර්යේෂණ නිගමනය**

යථාර්ථය, නිර්වාණය, සත්‍යය භාෂාවට නැඟිය නො හැකි ය. යථාර්ථය අවබෝධ කොට ගත යුත්තකි. එම අවබෝධය භාෂාමය සම්මුතියට නැඟූ කල පෘථග්ජන පුද්ගලයා ඇත-නැත යනාදි වශයෙන් ද සුඛ-දුක්ඛ යනාදී වශයෙන් ද වැරදි නිගමනවලට බැස ගනියි. දේශ, කාල, ජාති වශයෙන් වෙනස් වන භාෂාවකින් නිර්වාණය කෙසේ විස්තර කළ හැකි ද? පෙළදහම තුළ ද නිර්වාණයේ ස්වභාවය නන් අයුරින් විස්තර කර තිබේ. එම විස්තර කිරීම් නිවනේ පූර්ව භාගයට හා නිවනේ පසු භාගයට අයත් වේ. ඒ හැරුණු විට නිවන නම් නිශ්චිත ව මෙය යැයි භාෂාවෙන් දැක්විය නො හැකි ය. යථාර්ථය අතීන්ද්‍රිය ව ප්‍රත්‍යක්ෂ කළ යුතු ආධ්‍යාත්මික තත්ත්වයකි. එය භාෂාමය සඞ්කල්පයන් සමඟ එක් කළ එය අසන්නෝ ලෝක ව්‍යවහාරයට අදාළ ව්‍යාජ අර්ථ හා ස්වභාව එම යථාර්ථයට ආරෝපණය කරති. යථාර්ථය යට

පත්කර ඒ වටා සම්මුතික කාරණා හා අදහස් ගොඩ නඟා ගැනීම සිදු කරයි. එබැවින් සම්මුතියක් වූ භාෂාවකින් යථාර්ථයක් වූ නිර්වාණය යථාර්ථවත් ලෙස විස්තර කිරීම බෙහෙවින් අසීරු කර්තව්‍යයක් බව කිව හැකි ය. නිවන අස්තිත්වයක් ලෙස පිළිගැනුන ද නිවන පවතින නිශ්චිත ස්ථානයක් ප්‍රකාශ කළ නො හැකි බව ප්‍රකට කරනු වස් පෙළ තුළ නිවන විග්‍රහ කිරීමට නිශේධාර්ථ පද භාවිත කොට ඇති බව පෙනේ.

**ප්‍රමුඛ පද:** නිවන, නිශේධ පද, භාෂාව, භාෂා නිර්වචන, මූලාශ්‍රය

**මූලාශ්‍රය**

**ප්‍රාථමික මූලාශ්‍රය**


- **අඞ්ගුත්තරනිකාය 5.** (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **උදානපාළි.** (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ඛුද්දකනිකාය** 1. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **දීඝනිකාය** 1. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මජ්ඣිමනිකාය** 1,2,3. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සංයුත්තනිකාය** 1,2,4. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සුත්තනිපාතය.** (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.


**ද්විතීයික මූලාශ්‍රය**


- ගල්මංගොඩ, සුමනපාල (1994). **ආදි බෞද්ධ දර්ශනය-මූලධර්ම විග්‍රහයක්.** කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ.
- ජයසේකර, ආනන්ද සහ ජයසේකර, චිත්‍රා (2000). **තුලනාත්මක වාග්විද්‍යාව.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- විජයතුංග, හරිස්චන්ද්‍ර (2008). **ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය.** කොළඹ: ඇම්.ඩී ගුණසේන සමාගම.
- ශ්‍රී රේවත හිමි, බෝරුැග්ගමුවේ සහ සිරි තිලකසිරි (සංස්.). (2001). **සිංහල අකාරාදිය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- හෙට්ටිහේවා, පී. සහ පර්සි ජයමාන්න (2010). **සරසවි සිංහල - සිංහල ශබ්දකෝෂය.** නුගේගොඩ: සරසවි ප්‍රකාශන.